# විෂය - බුද්ධ ධර්මය

# 6 ශ්‍රේණිය

# නිපුණතාව 9.0

**බෞද්ධ ආර්ථික හා රාජ්‍ය පාලන චින්තනය හැඳින ගෙන ඒ අනුව ක්‍රියා කරයි.**

# නිපුණතා මට්ටම - 6.9.2

**සම්පත් පරිභෝජනයේදී දැඩි ලෝභය හානිකර බව පිළිගෙන ක්‍රියා කරයි.**

# පාඩම

**20 රන් පිහාටු**

අධ්‍යාපන අමාත්‍යාංශය ආගමික හා සාරධර්ම ශාඛාව

සැකසුම - අයි ජී වසන්ත කුමාර - ගුරු උපදේශක (බුද්ධ ධර්මය)
කොළඹ කලාප අධ්‍යාපන කාර්යාලය

**විෂය - බුද්ධ ධර්මය** **6 ශ්‍රේණිය**
**නිපුණතාව - 9.0**
**නිපුණතා මට්ටම - 6.9.2**
**පාඩම - 20 රන් පිහාටු**

- **01 සිට 05 දක්වා ප්‍රශ්නවල නිවැරදි පිළිතුරට යටින් ඉරක් අඳින්න.**

**01**. පන්සිය පනස් ජාතක පොත් වහන්සේ අයත් වන්නේ,

1. අනුරපුර යුගයටයි.
2. පොළොන්නරු යුගයටයි.
3. ගම්පොළ යුගයටයි.
4. කුරුණෑගල යුගයටයි.

**02**. පන්සිය පනස් ජාතක පොතෙහි බෝසත් චරිතයට අදාළ කථා වස්තු ගණන,

1. 500 කි.
2. 547කි.
3. 550කි.
4. 557කි.

**03**. ස්වර්ණ හංස ජාතකයෙන් ලබාදෙන ආදර්ශය පහත පිළිතුරුවලින් තෝරන්න,

1. දැඩි ලෝභය ධනවත් වීමට හේතුවේ.
2. දැඩිලෝභය සකසුරුවම්කමට හේතුවේ.
3. දැඩි ලෝභය සැපවත් වීමට හේතුවේ.
4. දැඩි ලෝභය දුකට පත් වීමට හේතු වේ.

**04**. ස්වර්ණ හංසයා ට පෙර භවය දැකීමේ හැකියාව ඇති වූයේ,

1. සිල් රැකීම් ආදී ගුණ නිසාය.
2. දේව බලයක් ලැබීම නිසාය.
3. පියාසර කිරීමේ හැකියාව නිසාය.
4. හංසයකු වී උපන් නිසාය.

**05**. පෙර ආත්ම භාවය දැකීමේ හැකියාව,

1. දිබ්බසෝත ඥානය නම් වේ.
2. ජාතිස්මරණ ඥානය නම් වේ.
3. දිබ්බචක්ඛු ඥානය නම් වේ.
4. චුතූපපාත ඥානය නම් වේ.

( ල. 10.)

අධ්‍යාපන අමාත්‍යාංශය ආගමික හා සාරධර්ම ශාඛාව
සැකසුම - අයි ජී වසන්ත කුමාර - ගුරු උපදේශක (බුද්ධ ධර්මය)
කොළඹ කලාප අධ්‍යාපන කාර්යාලය

**06.** **පහත "අ" සිට "ඒ" දක්වා වාක්‍ය දහයෙන් දැක්වෙන ස්වර්ණ හංස ජාතක කථාව පිළිවෙළට ලියා නැත. නිවැරදි පිළිවෙළ ලැබෙන සේ ඉදිරියේ ඇති කොටු තුළ අංක යොදන්න.**

අ. [ ] ස්වර්ණ හංසයා නිවසට පැමිණ රන් පිහාටුව බැගින් ලබා දෙයි.

ආ. [ ] ගලවන ලද පිහාටු සියල්ල සුදු පැහැ වේ.

ඇ. [ ] බිරිඳට සියලු පිහාටු ගලවාගැනීමට ලෝභ සිතක් ඇති වෙයි.

ඈ. [ ] බෝසතාණෝ ස්වර්ණ හංසයකු ව හිමාලයේ උපදී.

ඉ. [ ] දරුවන්ගේ විරෝධය නොතකා බැමිණිය සියලු පිහාටු ගලවයි.

ඊ. [ ] පෙර ආත්ම භාවය දැකීමේ නුවණින්, හංසයා තම පවුල දුක් විඳින අයුරු දකී.

උ. [ ] පෙර භවයේ බිරිඳට හා දරුවන්ට උදවු කිරීමට හංසයා සිතයි.

ඌ. [ ] රන් පිහාටු විකුණා පොහොසත් වන බිරිඳ බැල මෙහෙ කිරීම නවතයි.

එ. [ ] අධික ලෝභය නිසා බිරිඳ හා දරුවන් නැවත දුකට පත්වේ.

ඒ. [ ] හංසයා අසරණ වේ. අලුතෙන් එන පිහාටු ද සුදුය. ඔහු පියඹා යන්නට යයි.

(ල.10)

අධ්‍යාපන අමාත්‍යාංශය ආගමික හා සාරධර්ම ශාඛාව
සැකසුම - අයි ජී වසන්ත කුමාර - ගුරු උපදේශක (බුද්ධ ධර්මය)
කොළඹ කලාප අධ්‍යාපන කාර්යාලය

**6 ශ්‍රේණිය - බුද්ධ ධර්මය - පාඩම 20 - පිළිතුරු**

**01.** – 4 **02.** – 2 **03.** – 4 **04.** – 1 **05.** – 2 (ල.10)

**06.** අ - **4**

ආ - **8**

ඇ - **6**

ඈ - **1**

ඉ - **7**

ඊ - **2**

උ - **3**

ඌ - **5**

එ - **10**

ඒ - **9**

(ල.10)

අධ්‍යාපන අමාත්‍යාංශය ආගමික හා සාරධර්ම ශාඛාව

සැකසුම - අයි ජී වසන්ත කුමාර - ගුරු උපදේශක (බුද්ධ ධර්මය)
කොළඹ කලාප අධ්‍යාපන කාර්යාලය